# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - අම්පාර
# රැස්වීම් වාර්තාව

**01.දිනය** :- 2023.08.29 **වේලාව** - පෙ.ව. 09.30

**02.ස්ථානය** :- අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය.

**03.ප්‍රධානත්වය** :- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු.ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා.

**04.මෙහෙයවීම** :- දිස්ත්‍රික් ලේකම් චින්තක අබේවික්‍රම මහතා.

**05.සහභාගීත්වය** :- මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වූ දේශපාලන අධිකාරිය, නැගෙනහිර පලාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් සහ ආරක්ෂක අංශවල ප්‍රධානීන්ගේ පැමිණීමේ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම I)

**06. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම.**

දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිතුමන් විසින් දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව අමතමින්, මුලින්ම පැමිණ සිටි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු.ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පලාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇතුලු පළාත් සභාව නියෝජනය කරමින් පැමිණි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් ඉතා සුහදව පිළිගන්නා ලදි. අනතුරුව ගරු සමසභාපතිවරුන් වෙත දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා භාර දෙන ලදි.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු.ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා , සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දිස්ත්‍රික් ලේකම් ඇතුළු සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට, සියළුම ආයතන ප්‍රධානීන්ට, සියළුම ආරක්ෂක අංශවල ප්‍රධානීන්ට සහ අම්පාර දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය නිළධාරීන් පිළිගෙන මෙම සම්බන්ධීකරණ කමිටුව ප්‍රාදේශීය සංවර්ධන කමිටු විසින් විසඳාගත නොහැකි ප්‍රශ්න සහ වැදගත් ප්‍රශ්න සාකච්ඡා කරන කමිටුවක් බවත්, ගරු මන්ත්‍රීතුමන්ලා සහ රාජ්‍ය නිළධාරීන් ඒගැන සැලකිල්ලට ගෙන ප්‍රශ්න යොමු කරන ලෙසත්, එසේ නොමැතිව යොමු කරන ප්‍රශ්න සාකච්ඡා කිරීමට විශාල කාලයක් ගත වන නිසාත් මෙවර යොමු කරණ ලද ප්‍රශ්න විශාල ප්‍රමාණයක් ඉවත් කිරීමට සිදුවූ බවත් පැවසීය. ඉන්පසු ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනයට සහ 2023 යල කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්තුමන්ට ආරාධනා කරන ලදී.

**07. ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය.**

**7.1 2023 යල කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.**

දිසාපතිතුමන් විසින් මෙම වැඩසටහන් යටතේ දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව කෙටියෙන් පැහැදිලි කිරීමක් සිදු කරනු ලැබීය.

ජාතික මට්ටමින් ආහාර සුරක්ෂිතතා වැඩසටහන ක්‍රියාත්මක කරන අතර අම්පාර දිස්ත්‍රික්කයේ 2023 යල කන්නයේ වී වගාවෙන් මෙවර හෙක්ටයාර 63869ක සිදුකර ඇති බවත් අපේක්ෂිත අස්වැන්න මෙට්‍රික්ටොන් 280000ක් බවත් මේවන විට 95%ක් පමණ අස්වැන්න නෙලා අවසන් බවත් මෙවර අම්පාර දිස්ත්‍රික්කයේ අස්වැන්න සරු බවත් ප්‍රකාශ කරන ලදී. මෙවර වෙළඳපලේ වී මිළ යහපත් තත්වයක පවතින බවත් මේ වන විට වී කිලෝවක් සඳහා රු 110.00 පමණ මිලක් පවතින බවත් පැවසීය. මේවන විට 2023/2024 මහ කන්නය සඳහා

සූදානම්වන බවත් හෙක්ටයාර 87861ක වගා ඉලක්කයක් ඇති බවත් සඳහන් කරන ලදී. මහ කන්නයේ පොහොර නිර්දේශය මේවන තෙක් ලැබී නොමැති බවත් යල කන්නය අනුව පොහොර අවශ්‍යතාව වී වගාව සඳහා යූරියා මෙට්‍රික්ටොන් 13569, MOP 3725,TSP 3417 සහ බඩ ඉරිඟු වගාව වෙනුවෙන් හෙක්ටයාර 13000ක් සඳහා යූරියා මෙට්‍රික්ටොන් 4559ක් අවශ්‍ය බවත් පැවසීය.

## 08. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂතුමා විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් පැහැදිළි කිරීමක් කරන ලදී. මේ යටතේ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති 2 (රුපියල් මිලියන 06 සහ රුපියල් මිලියන 1) එළවළු බෙදාදීමේ ව්‍යාපෘතිය, අලි වැට ව්‍යාපෘතිය සහ ලෝක ආහාර වැඩසටහනේ ප්‍රතිපාදන අනුව ක්‍රියාත්මක පෙර පාසල් උදේ ආහාර ලබා දීමේ වැඩසටහන ලෙස ව්‍යාපෘතීන් ක්‍රියාත්මක බව පැවසීය. (ඇමුණුම 02)

## 09. දිස්ත්‍රික් මට්ටමින් විදේශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය

**9.1** කෘෂි නවීකරණ ව්‍යාපෘතිය (ASMP)

මෙම වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කීපයක වගා ව්‍යාපෘති 6ක්, යටිතල පහසුකම් හා ධාරිතා සංවර්ධන සඳහා රුපියල් මිලියන 2000ක් පමණ වෙන්වී ඇති බවත් මේ වනවිට රු. මිලියන 520 ක පමණ කාර්යයන් ඉටුකර ඇති බවත්, බඩඉරිඟු වගාව සඳහා ඉඩම් තෝරා ගැනීම සම්බන්ධව ගැටළු කීපයක් ඇතිබවත් ඒ සම්බන්ධව අදාළ පාර්ශව සමග සාකච්ඡා පැවැත්වෙන බවත් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කමිටුවට දන්වන ලදී. (ඇමුණුම 03)

**9.2** දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)

2023 වසරේ අංශ දෙකක් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවත්, ඉන් පළමුවැන්න යටතේ වැව් සහ වාරි මාර්ග 20 ක් ප්‍රතිසංස්කරණය කිරීම සිදු කෙරෙන අතර ඒ සඳහා රු. මිලියන 697ක් පමණ ප්‍රතිපාදන වෙන් වී ඇති බවත් දැනට රු. මිලියන 394.94 ක් වියදම් කර ඇති බවත්, කොමාරි වාල්කුලි වැව ප්‍රතිසංස්කරණය සඳහා වන සංරක්ෂණ ගැටළුවක් ඇති බැවින් එය අදාළ පාර්ශව සමග සාකච්ඡා කර විසඳුමක් ලබා ගන්නා බවත් මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කමිටුවට දන්වන ලදී. දැනට කටයුතු නවත්වා ඇති පොතුවිල් ඔලිමඩු ඇනිකට් ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන මෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති ගරු ඩබ්.ඩී. වීරසිංහ මන්ත්‍රීතුමන් විසින් දන්වන ලදී.
දෙවැන්න යටතේ තෝරාගත් ප්‍රදේශ කීපයක වගා ළිං ඉදිකළ බව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දැන්වූ අතර අදාළ තෝරා ගැනීම් වලදී ගොවි සංවිධාන ආදිය ද සම්බන්ධ කරගන්නා ලෙස ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමන් විසින් දන්වන ලදී. (ඇමුණුම 04)

**9.3** ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)

මෙම ව්‍යාපෘතිය ලෝක බැංකුවේ, යුරෝපා සංවිධානයේ ආධාර හා ලක් රජයේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් බවත්, අදියර 2ක් (මූලික හා කාර්‍ය සාධන අදියර) යටතේ ව්‍යාපෘති 321 ක් ක්‍රියාත්මක බවත් රු. මිලියන 1181ක පමණ ප්‍රතිපාදන මේ යටතේ අනුමත වී ඇති බවත් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් සඳහන් කරන ලදී. තවද 2024 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙන බව වැඩිදුරටත් සඳහන් කරන ලදී. (ඇමුණුම 05)

**9.4** වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහනට ( CresMPA ) අදාළ ව්‍යාපෘති

මෙම ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 35ක් සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී ඇති බව වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් සඳහන් කළ අතර, මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලැබී තිබේද යන ගැටළුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති ගරු ඩබ්.ඩී. වීරසිංහ මන්ත්‍රීතුමන් විමසන ලදී.

නමුත් මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ ව්‍යාපෘති පිළිබද සලකා නොලබා තිබීම සම්බන්ධව, ඉන්පසු දීර්ඝ වශයෙන් කරුණු විමසීමෙන් අනතුරුව දැනට නතර වී ඇති ව්‍යාපෘති සම්බන්ධව හා අවශ්‍ය අක් මුදල් ප්‍රමාණයන් පිළිබදව තොරතුරු තමන් වෙත ලබා දෙන ලෙසත්, සම්බන්ධීකරණ කමිටුවෙන් අනුමත කරනු ලබන ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීමට යොමු කරන ලෙසත් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සම සභාපති ගරු ඩබ්.ඩී. වීරසිංහ මන්ත්‍රීතුමන් විසින් දනුම් දෙන ලදී.

**9.5** වාරිමාර්ග අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමණාකරණ ව්‍යාපෘති (IWWRMP)

මේ යටතේ රු. මිලියන 83.3 ක ප්‍රතිපාදන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වෙන් කරඇති බවත් එමගින් ව්‍යාපෘති 35 ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බවත්, ඉන් ව්‍යාපෘති 22 ක් සදහා මේ වනවිට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය දී ඇති බවත් වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් සදහන් කරන ලදී.

තවද මෙම ව්‍යාපෘති ගොවි සංවිධාන හරහා සිදු කළ යුතු අතර මේ වනවිට අදාළ තෝරාගත් ගොවි සංවිධාන ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට පෙර ගෙවීමක් ඉල්ලා සිටින නමුත් ව්‍යාපෘති ගිවිසුම අනුව පෙර ගෙවීමක් කිරීමට නම් අදාළ ගොවි සංවිධාන විසින් ඇපකරයක් තැබිය යුතු බැවින් දැනට ව්‍යාපෘති කටයුතු සිදු කිරීම සදහා ගැටළුවක් පවතින බව වැඩිදුරටත් සදහන් කරන ලදී.

## 10. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | 1.අම්පාර නගර මධ්‍යයේ වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම.<br>2.අම්පාර නව නගර ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම.<br>3. රජයේ නිල නිවාස පිහිටි ඉඩම් නගර සංවර්ධන කටයුතු සදහා යොදා ගැනීම. | අම්පාර නගර මධ්‍යයේ වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමේ යෝජනාව අනුමත කරන ලද අතර අනෙක් යෝජනා අම්පාර නගර සංවර්ධන සැලැස්ම පිළිබද කමිටුවේදී සාකච්ඡා කිරීම සදහා තීරණය විය. |
| 02. | අම්පාර, කරංගාව ග්‍රාම නිලධාරී වසමේ, අම්පාර-උහන මාර්ගයට මුහුණ ලා පිහිටි කඩඉම් සිතියම් අංක 280003 හි කැබලි අංක 113, 114 හා 115 යන ප්‍රමාණයෙන් හෙක්ටයාර 1.5870 ක් පමණ වූ ඉඩමේ නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීම සදහා. (ඛණ්ඩාංක 7.30934, 81.66829) | මෙහි නිරාකරණය කරගත යුතු ගැටළු ඇති බැවින් අම්පාර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කොට තීරණයක් ලබා ගැනීමට තීන්දු විය. |
| 02. | කල්මුණේ වෙරළබඩ ආසන්නයේ රෙස්ට් හවුස් මාර්ගයේ පිහිටි සැලසුම් අංක PP AM 4412හි කැබලි අංක 02 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1757 ක් පමණ වූ "කඩත්කරෙයිපුම්" නැමැති ඉඩමෙහි සංචාරක පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සදහා. (ඛණ්ඩාංක 7.42304, 81.83100) | අනුමත කරන ලදී. |
| 04. | කල්මුණේ වෙරළබඩ ආසන්නයේ වෙරළ පාරට මුහුණ ලා පිහිටි සැලසුම් අංක P.P.A 794 හි කැබලි අංක 27 න් කොටසක (දළ වශයෙන් අක්කරයක් පමණ) වෙරළ උද්‍යාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සදහා | අනුමත කරන ලදී. |
| 05. | අම්පාර දිස්ත්‍රික්කයේ නොවිසදුණු ඉඩම් ගැටලු සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවේදී අවධානය යොමු කරන ලද අම්පාර නගර සීමාවේ නේවාසික ඉඩම් | මේවන විට ක්‍රියාත්මක නිවාස යෝජනා ක්‍රමයට මෙය අදාල නොකොට, ඉදිරි කටයුතු වලදී ක්‍රියාත්මක කිරීම සදහා කමිටුව මගින් සාකච්ඡා කිරීමට තීරණය විය. |

| | | |
|---|---|---|
| | අවම භාවිතය පර්චස් 15 සිට 10 දක්වා අඩු කිරීම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම. | |

## 11. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු

| අනු අංකය | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | ඔලුවිල් වරාය කටයුතු නැවත ආරම්භ කිරීම | සෑම වර්ෂයකදීම වරායේ වැලි ඉවත් කිරීමට සිදුව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ගරු වරාය කටයුතු ඇමතිතුමා සමඟ පැවති සාකච්ඡාවේදී වැලි ඉවත් කිරීමේ යන්ත්‍රයක් ලබා ගැනීමට ප්‍රතිපාදන ලබා දීමට පොරොන්දු වී ඇති බව දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වී රසිංහ මැතිතුමා දන්වන ලද අතර නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා විසින් මාලදිවයින වැනි රටවල මෙම වැලි සඳහා ඉල්ලුමක් ඇති බවත් ඒ සඳහා අවධානය යොමු කිරීම සුදුසු බවත් දැන්වීය. |
| 02. | ව්‍යාපෘති සඳහා ලබාදී ඇති ප්‍රයෝජනයට නොගත් ඉඩම් අවලංගුකර නව ආයෝජකයන්ට ලබාදීම. | ව්‍යාපෘති ආරම්භ නොකර වසරකට වැඩි කාලයක්වන ව්‍යාපෘති සඳහා ලබාදී ඇති ඉඩම් නැවත අත්පත් කර ගන්නා ලෙසත් ඒ සම්බන්ධ වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට එවන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දැනුම් දෙන ලදී. |
| 02. | ජාතික විදුලිබල පද්ධතියට එක්කිරීමට, රජයේ ඉඩම් බලශක්ති ව්‍යාපෘති සඳහා වෙන් කිරීමට පියවර ගැනීම. | විදුලි සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන වල සිට කිලෝමීටර 20ක් තුල ඇති රජයේ ඉඩම් වෙනත් ව්‍යාපෘති සඳහා වෙන් නොකොට බලශක්ති උත්පාදන ව්‍යාපෘති සඳහා පමණක් වෙන්කොට තබා ගැනීමට තීරණය විය. |
| 04. | ඉස්සන් වගාව සඳහා වැඩි අවස්ථා නිර්මාණය කරමින් ජලජීවී අංශය ක්ෂණික අස්වැන්න සඳහා වැඩිදියුණු කිරීම. (ධීවර අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි) | ඉස්සන් වගාව සඳහා සුදුසු ඉඩම් ධීවර අමාත්‍යාංශය හරහා හඳුනාගෙන ව්‍යාපෘති වාර්තාවක් සකස්කර ඊලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලෙස ධීවර දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ වෙත කමිටුව විසින් දැනුම් දෙන ලදී. |
| 05. | නීතිවිරෝධී ලෙස ආක්‍රමණය කර ඇති රජයේ ඉඩම් වහාම අත්පත් කර ගැනීම | මේ පිළිබඳ තත්ත්ව විශ්ලේෂණයක් සිදුකර ඒ අනුව නීති විරෝධී ලෙස ආක්‍රමණ කර ඇති ඉඩම් අත්පත්කර ගැනීමට කටයුතු සිදුකරන ලෙස දිස්ත්‍රික් ලේකම්තුමාට පවසන ලදී. මෙහිදී දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා දීර්ඝ කාලයක් තිස්සේ රජයේ ඉඩම්වල හේන් ගොවිතැන් කල ගොවීන් හට මෙය අදාල නොකරලන්නා ලෙසද ප්‍රකාශ කරන ලදී. |
| 06. | දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහල, මධ්‍යම රජය යටතට පවරා ගැනීම. | අනුමත කරන ලදී. |
| 07. | අම්පාර-ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රදැල්ල වාරි යෝජනා ක්‍රමය | අනුමත කරන ලදී. |
| 08. | දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරී කාර්යාලයක් ස්ථාපිත කිරීම. | අනුමත කරන ලදී. (ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විමලවීර දිසානායක මැතිතුමා අම්පාර සිට දෙහිඅත්තකණ්ඩියට 174Km ඇති බවත් මෙම කාර්යාලය අත්‍යාවශ්‍ය බවත් පැවසීය.) |
| 09. | පාරිසරික වශයෙන් අධිසංවේදී සින්න උල්ල, පොතුවිල් 18 ග්‍රාම නිළධාරී වසමේ | දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කොට තීන්දුවක් ගැනීමට තීරණය විය. |

| | | |
|---|---|---|
| | පිහිටා ඇති ස්වාභාවික වෙරළබඩ ශාක ප්‍රජාවකින් යුත් ආරුගම්බේ උල්ල වැලි කඳුවැටිය සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා දීර්ඝකාලීන බදු පදනම යටතේ බලපත්‍රලාභීන් වෙත ලබාදීමට 2023.03.14 දින පැවති පොතුවිල් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණය අත්හිටුවීමට තීරණය ගැනීම. | |
| 10. | පසුගිය වසර තුනක කාලය තුල මුහුදු ඛාදනය වැඩිවීම වේගවත්ව සිදුවන අතර, මෙයින් වැඩි වශයෙන් හානියට පත් ප්‍රදේශ වන්නේ<br>01.නින්දවූර් වවුවාල්ඔඩේ -<br>02.මාලික්කාඩු හා සයින්දමරුදු<br>03.තිරුක්කෝවිල්<br>04. කාර්තිව්<br>මේ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා ව්‍යසන කළමනාකරණ ජාතික සභාව වෙත ඉදිරිපත් කිරීමට | මේ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා ලෙස ආපදා කළමණාකරන දෙපාර්තමේන්තුවට දන්වන ලදී. |
| 11. | ඔළුවිල් වරායෙන් ඉවත්කරන ලද මුහුදු වැලි කන්දක් ඉවත්කිරීම සඳහා කටයුතු සිදුකරනු ලබන අතර මෙම වැලි පාසල් වල ගංවතුර වැලැක්වීමට දැමිය හැකිය. ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම | වැලි අවශ්‍ය පාසැල් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස අදාල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට දන්වන ලදී. |
| 11. | අප දිස්ත්‍රික්කයේ වනඅලි හානිය අවම කිරීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව මගින් අලින්ට GPS Collar දැමීම හා මිනිසුන් දැනුවත් කිරීම. | මෙම GPS Collar මේවන විට මිළ අධික බවත් දමා ඇති GPS Collarවල බැටරි ආයු කාලය වසර 2 බවත් මේ සඳහා ප්‍රතිපාදන අමාත්‍යාංශය මගින් වෙන් කර නොමැති බවත් වනජීවී දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ පැවසීය. |
| 13. | අම්පාර දිස්ත්‍රික්කය තුළ මුහුදු වෙරළ ප්‍රදේශ හා පහත් බිම් මුඩු බිම් වල, අනවසර ඉදිකිරීම් සිදුවීම අවම කිරීම සඳහා Drone තාක්ෂණය භාවිතා කර සිතියම් ඇඳ ඒ අනුව ඉදිකිරීම් කටයුතු සිදුකිරීම. | ඔලුවිල් විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව සිදුකරන මෙම කාර්ය සඳහා අදාල ආරක්ෂක අංශවල අවසරය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අනුමැතිය ලබාදෙන ලදී. |
| 14. | මල්කම්පිටි ඇලෙන් කිඹුලන් ඉවත් කිරීමට පියවර ගැනීම. | වනජීවී දෙපාර්තමේන්තුව මගින් කිඹුලන් අල්ලා ඉවත් කිරීමට එකඟ විය. |
| 15. | සම්මන්තුර නවිදන්වේලි සීමා පිළිබඳ ගැටළුව | මේ සම්බන්ධයෙන් කමිටුවක් පත්කර වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් දිස්ත්‍රික් ලේකම් වෙත දන්වන ලදී. |
| 13. | වලතාපිටිය 1 කොට්ඨාශයේ වනජීවී දෙපාර්තමේන්තුව විසින් අත්පත්කර ඇති ඉඩම් අක්කර 40 නිදහස් කර සුදුසු ගොවීන් වෙත ලබාදී ආර්ථික යහපැවැත්මට සලසාලීමට සුදුසු ක්‍රියා මාර්ග ගැනීම. | වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙත නිදහස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇති බව වනජීවී සහකාර අධ්‍යක්ෂ කමිටුවට දැන්වීය. මෙම ඉඩම් ලබාදෙන ගොවීන්ගේ ලැයිස්තුව කමිටුවට ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වන ලදී. |
| 13. | පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තරුණ ප්‍රජාව සඳහා දීර්ඝ කාලයක සිට ක්‍රීඩා පිටියක අවශ්‍යතාව ඇති අතර ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා පොතුවිල් 11 (වට්ටිවෙලි) වසමට අයත් ඉඩමක් වෙන් කිරීම | දිස්ත්‍රික් ලේකම්තුමා මගින් කමිටුවක් පත් කොට ඉදිරි කටයුතු කිරීමට තීරණය විය. |
| 18. | පාසල් වල ක්‍රීඩා භාණ්ඩ හිඟය සම්බන්ධව සාකච්ඡා කිරීම. | අත්‍යාවශ්‍ය ක්‍රීඩා භාණ්ඩවල ලැයිස්තුවක් සකස් කර නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමාටත් දිස්ත්‍රික් දේශපාලන අධිකාරියටත් යොමු කරන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට දන්වන ලදී. |

| | | |
|---|---|---|
| 19. | දෙහිඅත්තකණ්ඩිය බල ප්‍රදේශය තුල සංචාරක අමාත්‍යාංශය මගින් අත්තනෝමතිකව රටබීම බලපත්‍ර ලබාදීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් මෙය වහාම අත්හිටුවීමට තීරණය කරන ලද අතර කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ වෙත දන්වන ලදී. |

## 12. සාකච්ඡාකල වෙනත් යෝජනා

- ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය තිලක් රාජපක්ෂ මැතිතුමා විසින් මෙවර රාජ්‍ය පළාත් ක්‍රීඩා උළෙලට සහභාගී වූ අනෙක් පළාත් ක්‍රීඩකයින්හට සම්පූර්ණ ක්‍රීඩා ඇඳුම් කට්ටලය (සපත්තු ඇතුළුව) ලබා දී තිබූ බවත් නැගෙනහිර පළාත් ක්‍රීඩකයින්හට ක්‍රීඩා ඇඳුමේ උඩ කොටස පමණක් ලබාදීම සම්බන්ධයෙන් විමසන ලදී. මේ සම්බන්ධයෙන් විමර්ශණය සතියක් ඇතුලත තමාවෙත වාර්තාවක් ලබා දෙන ලෙසත්, මින් ඉදිරියට මෙවැනි දේ සිදු නොවීමට වගබලා ගන්නා ලෙසත්, අපහසුතා ඇත්නම් දේශපාලන අධිකාරියට හෝ තමාට දන්වන ලෙසත් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා විසින් පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී.
- ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් කල්මුණ උතුර පොලිස් ස්ථානයේ ඇති අඩුපාඩු සහ එම ස්ථානයෙන් ඉවත්වන ලෙස දැනුම් දී ඇති බැවින් වෙනත් ස්ථානයක පොලිස් ස්ථානය සදහා ගොඩනැගිල්ලක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. මෙම ඉඩම පුද්ගලික බව ප්‍රාදේශීය ලේකම්තුමන් සදහන් කල අතර එම ඉඩම පිළිබඳ නිවැරදිව සොයා බලා රජයේද පුද්ගලිකද යන්න තහවුරු කර තීරණයක් ගැනීමට යෝජනා විය.
- ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය තිලක් රාජපක්ෂ මැතිතුමා විසින්දිස්ත්‍රික් සීමා මායිම් ගැටළු මාදුරුඔය ඉක්කාගල අවට ඇතැම් ප්‍රදේශවල පවතින බව සදහන් කලේය. මේ සදහා ඊළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට මඩකලපුව දිස්ත්‍රික් ලේකම්වරයා සහ අදාල නිළධාරීන් කැදවීමට කමිටුව විසින් තීරණය කරන ලදී.
- ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කලෛ අරසන් මැතිතුමා විසින් කල්මුණ උතුර සම්බන්ධීකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම සම්බන්ධයෙන් දැඩිව අවධාරණය කරන ලදී. එහිදී දිසාපතිතුමන් එම කරුණ පැහැදිලි කරමින් කල්මුණ උතුර උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් බවත් එහි සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙක් සිටින බවත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මෙය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස පිළිනොගන්නා බවත් පැවසීය. එනිසා කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම ප්‍රමාණවත් බවත් පැවසීය.
- ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා විසින් පසුගිය දා පැවති අනවසර කුඹුරු ගොඩකිරීම් වැලැක්වීමේ රැස්වීමේදී ගත් තීරණ අනුව ආරක්ෂක මුර පොලවල් ඉදිකරද ඒ සඳහා අදාල ආයතනවල නිළධාරීන්ගේ සහයෝගය නොලැබෙන බව පැවසීය. එනිසා එයට නිළධාරීන් යොදවන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට දැන්වීය.

## 13. ස්තුති කථාව:-

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් පැමිණ සිටි සියලුදෙනාට ස්තුතිය පළකර රැස්වීම අවසන් කරන ලදී.

චින්තක අබේවික්‍රම,
දිස්ත්‍රික් ලේකම්
අම්පාර

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

**දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය**

**2023.08.29**

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1 | චින්තක අබේවික්‍රම | දිස්ත්‍රික් ලේකම් | |
| 2 | ගරු සෙන්තිල් තොන්ඩමන් | ආණ්ඩුකාරවර | |
| 2 | ගරු ඩබ්.ඩී.වීරසිංහ | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 4 | ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 5 | ගරු ඩබ්. දිසානායක | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 6 | ගරු එස්.එම්.එම්.මුසම්මිල් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 2 | ගරු ටී. කලෙයි අරසම් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 8 | ගරු ඒ.එල්.එම්.අතාවුල්ලා | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 9 | වෛද්‍ය කේ. මොහන් කුමාර් | DPDHS | DPDHS |
| 10 | ආර්. අබිරීපිතන් | ජලජීවී වගා සංවර්ධන නිළධාරී | ජලජීවී වගා සංවර්ධන නිළධාරී |
| 11 | ඉංජි. යූ.එල්.ඒ. නසාර් | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග ඉංජිනේරු |
| 12 | ඉංජි. පී විභාර්නන් | වාරිමාර්ග ඉංජිනේරු- තම්බිඔලුවිල් | වාරිමාර්ග ඊංජිනේරු- තම්බිඔලුවිල් |
| 13 | එන්.තමිල් වෙල්වන් | DCS Planning | DCS Planning |
| 14 | ඩී.එස්.යූ. මවුලානා | ZDE සම්මන්තරය | ZDE සම්මන්තරය |
| 15 | ටී.එස්.ඩී. පීරිස් | ZDE දෙහිඅත්තකණ්ඩිය | ZDE දෙහිඅත්තකණ්ඩිය |
| 16 | එච්.ඊ.එම්.පී.පී. දිසානායක | ලේකම් MOE-ED | ලේකම් MOE-ED |
| 17 | එෆ්. රාසමොහන් | CE RDD අම්පාර | CE RDD අම්පාර |
| 18 | ඉංජි.එන්.එම්.එම්. මුනාස් | IE RDD කල්මුණ | IE RDD කල්මුණ |
| 19 | කේ.ෂිවකුමාර් | DSSO | DSSO |
| 20 | කේ.යෝගරාජන් | TO RDD | TO RDD |
| 21 | එම්.ඒ.යූ.එල්. කුමාර | SPO අම්පාර | SPO අම්පාර |
| 22 | යූ.එම්.එස්.එස්. නජීම් | ZDE කල්මුණ | ZDE කල්මුණ |
| 23 | වෛද්‍ය එස්.ඩී.එම්. මාහිර් | DD/Dept APTH අම්පාර | DD/Dept APTH අම්පාර |
| 24 | එස්.බී.දිසානයක | DD Ag | DD Ag |
| 25 | අයි.කේ.පී. මුතුබණ්ඩා | ලේකම් /කෘෂිකර්ම | ලේකම් /කෘෂිකර්ම |
| 26 | එම්.එම්.බී.පී.එම්. රෂාඩ් | Provincial Coordinator | Provincial Coordinator |
| 27 | ඉංජි. ඒ. රාජේෂ්කුමාර් | වාරිමාර්ග ඉංජිනේරු පොතුවිල් | වාරිමාර්ග ඉංජිනේරු පොතුවිල් |
| 28 | වෛද්‍ය එන්.බී.එම්. ෆෙරෝස් | වෛද්‍ය සැළසුම් RDHS | වෛද්‍ය සැළසුම් RDHS |
| 29 | ආර්.එම්.එස්. මැණිකේ | MSO | MSO |
| 30 | අනුෂ එන්.එම් | ICTA- RDHS Ampara | ICTA- RDHS Ampara |
| 31 | කේ. දේවරාජා | SM Eng. Asmp/EP | SM Eng. Asmp/EP |
| 31 | ඒ.ඒ.ජලීල් | IFMA Industries Ampara | IFMA Industries Ampara |
| 33 | ටී.එම්. එම්. අන්සාර් | ප්‍රාදේශීය ලේකම් | අක්කරපත්තු |
| 34 | වයි.ජපාකරන් | ප්‍රාදේශීය ලේකම් | අලයාඩිවෙම්බු |
| 35 | යූ.පී. සදරුවන් අනුරුද්ද | ප්‍රාදේශීය ලේකම් | අම්පාර |
| 36 | ඒ.එම්.ඒ.කුමාරි | ප්‍රාදේශීය ලේකම් | දමන |
| 37 | එම්.එස්.එම්. රෂාන් | ප්‍රාදේශීය ලේකම් | ඉරක්කාමම් |
| 38 | ජේ.ලියාකත් අලි | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ |
| 39 | එස්.ජෙගරාජන් | ප්‍රාදේශීය ලේකම් | කාරතිවු |
| 40 | තිලිත වික්‍රමරත්න | ප්‍රාදේශීය ලේකම් | මහඔය |
| 41 | ආර්.රාහුලනයාහි | ප්‍රාදේශීය ලේකම් | නාවිතන්වෙලි |
| 42 | ඒ.එම්.අබ්දුල් ලතීෆ් | ප්‍රාදේශීය ලේකම් | නින්දවූර් |
| 43 | බී.වී.එස්. ගුණසේන | ප්‍රාදේශීය ලේකම් | පදියතලාව |
| 44 | එම්.අයි. ෆෙමස් | ප්‍රාදේශීය ලේකම් | පොතුවිල් |
| 43 | එස්.එල්.එම්.හනිෆා | ප්‍රාදේශීය ලේකම් | සමන්තුරෙයි |
| 46 | චින්තන උදාර නානායක්කාර | ප්‍රාදේශීය ලේකම් | උහන |

දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය
2023.08.29

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 47 | එන්.නවනීතරාජා | ප්‍රාදේශීය ලේකම් | ලාහුගල |
| 48 | ටී.ජේ.අදිෂයිරාජ් | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ උතුර |
| 49 | ටී.ගජේන්ද්‍රන් | ප්‍රාදේශීය ලේකම් | තිරුක්කෝවිල් |
| 50 | එච්.ටී.කුමාරගේ | ප්‍රාදේශීය ලේකම් | දෙහිඅත්තකණ්ඩිය |
| 51 | එන්.මනිවානන් | ලේකම් CM Ministry | CM Ministry |
| 52 | ජේ.ඒ.එස්.ජයලත් | CSO | කෘෂිකර්ම |
| 53 | පී.එම්.වී. අරංගත් | DDE | කලාප අධ්‍යාපන කාර්යාලය / සමන්තුර |
| 54 | එම්. ඒ. ජයා | ADFO | වන සංරක්ෂණ |
| 55 | ඩබ්.එච්.එම්.ඩබ්.ඉණ්ඩාර | ADFO | වන සංරක්ෂණ |
| 56 | ඒ.එල්.එම්. අජ්මි | කොමසාරිස් MC Kalmunai | නගරසභාව කල්මුණ |
| 57 | එච්.කේ.කුමාරසිරි | CAO | යුද හමුදාව |
| 58 | ඒ.එස්.පී. ද සිල්වා | | Army 24 Division |
| 53 | ඒ.පී.පී.අබේවර්ධන | | සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුව මහඔය |
| 60 | ඒ.එම්. රහමතුල්ලා | කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ | අක්කරපත්තු |
| 61 | කේ.යූ.ප්‍රින්ත | සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුව | මහඔය |
| 62 | එස්. පුවනේන්තිරන් | ADDE | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 63 | එල්.යූ.අයි. ලොකුසූරිය | PD MOTF | MOTF |
| 64 | එච්.ඒ.බී.එස්. ආරියදාස | AD | ADTF |
| 65 | ටී.එල්.සනීර් | DDE | CCB |
| 66 | පී.කේ.සී.කරුණාරත්න | OIC | UDA |
| 67 | ඩබ්.අයි. වික්‍රමසූරිය | REM | UDA |
| 66 | ඩබ්. සුරන්ජන් | AD | ධීවර |
| 69 | ඩබ්.එම්.අයි.ඒ. විජේකෝන් | STN | Stat Division |
| 70 | ජේ.එම්.රශාල් | OT | CEHC |
| 71 | ඒ.එල්.අයි. ඛානු | ඉඩම් කොමසාරිස් | LCGS |
| 72 | සී.එස්. මුසම්මිල් | | |
| 73 | එස්.ආර්. හසන්ත | ZDE | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 74 | වෛද්‍ය. එම්. බී. අබ්දුල් වාජිත් | DRDHS | සෞඛ්‍ය සේවා |
| 75 | පී.ඩී.අයි.රම්‍යලතා | RPM | වාරිමාර්ග |
| 76 | එන්. ශ්‍රීකාන්ත් | OIC | සුරාබදු දෙපාර්තමේන්තුව |
| 77 | ජේ.ඒ.සී.එස්.විදුරංග | IPR Excise | සුරාබදු දෙපාර්තමේන්තුව |
| 76 | කේ.එල්.එම්.ස්මයිල් | CE | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 79 | එෆ්.ඩී.ඩී.ලක්මාල් | CE | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 60 | ඉංජි.ජේ.ඒ.අලිල් | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 81 | ඉංජි.යූ.කේ.එම්. මුසාජිත් | ප්‍රාදේශීය කළමණාකරු | ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 62 | ඩී.එම්. රත්නපාල | | ශ්‍රී ලංගම |
| 83 | කේ.පී.අයි.මධුරංගනී | CSSDO | සිවිල් ආරක්‍ෂක දෙපාර්තමේන්තුව |
| 84 | එච්.එම්.ඒ.බණ්ඩාර | ප්‍රධාන කළමණාකරු | ගල්ඔය වැවිලි සමාගම |
| 85 | එම්.එෆ්.ඒ. ෂනීර් | | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 86 | පී.එම් ද සිල්වා | R/A | DWFC |
| 87 | ප්‍රියන්ත එල් විමලදාස | | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 88 | එම්.ඩී.නන්නුදීන් | Engineer | RDA |
| 89 | ආර්.ඒ.එම්. අස්මීර් | | RDA කල්මුණ |
| 90 | එම්.වයි.එම්. නෞෂාඩ් | CE | CCB |
| 91 | පී.පී.අයි.නදිෂානි | LUPO | ඉඩම් පරිහරණ |
| 92 | ඒ.කේ.නිෂාන්ත | A.A.I.B. Ampara | DO |

**දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය**

**2023.08.29**

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 93 | එන්.පී.සී.අයි.නිස්සංක | ZDE | මහඔය |
| 94 | ඒ. මන්සූර් | ලේකම් | |
| 95 | ජේ.ජේ.මුරලිදරන් | ලේකම් | සෞඛ්‍ය අමාත්‍යංශය |
| 96 | එම්.ඒ.ආර්.මොහොමඩ් | ලේකම් | සමන්තුර ප්‍රාදේශීය සභාව |
| 97 | එස්.රවිකුමාර් | AD(CH) EP | NAEDA |
| 98 | නාමල් ජයසිරි | RDM | MASL - C |
| 99 | කමල් නෙත්මිණ | ACLG | ACLG Office |
| 100 | ඒ.ඩී.වී.පී.කුමාර් | OIC | NIFMI Ampara |
| 101 | පී.අච්චුදන් | ABSMLO | ESIAP-EO |
| 102 | එස්.උදයරාජන් | AD | CEA |
| 103 | එස්. සුදාහරන් | PA - Fisherish | Fisherish - EP |
| 104 | ඩබ්.ඒ.ජේ.ආර්.ප්‍රනාන්දු | AD/NAQDA | Fisherish |
| 105 | වී.කරුණානන්තන් | PD/ Road | RDD |
| 106 | ඒ.එම්.හබීබු රහමන් | ලේකම් | ප්‍රාදේශීය සභාව, පොතුවිල් |
| 107 | වෛද්‍ය ටී.එම්.සී.එල්.බී. තෙන්නකෝන් | නියෝජ්‍ය අධ්‍යක්ෂ | මහ රෝහල, අම්පාර |
| 106 | ඒ.එම්. උවයිස් | AE | RDA |
| 109 | සුදත් ගමගේ | DI | වාරිමාර්ග |
| 110 | ඒ.ඩී.ඩී.නෙත්තසිංහ | SP | STF |
| 111 | පී.සිවතෙරියන් | TO | ගොඩනැගිලි දෙපාතර්මේන්තුව |
| 112 | ඒ.පී. අයිරාංගනී | දිස්ත්‍රික් කළමණාකරු | නිවාස ධිකාරිය |
| 112 | එම්.තුලයිතන් | AE | CCO |
| 114 | වයි.ටී.සම්පන්තන් | සහකාර ඉංජිනේරු | විදුලි බල මණ්ඩලය - කල්මුණ |
| 115 | ටී.සිවසුබ්‍රමනියම් | CE/ Akk | RDD |
| 116 | මොහාන් අබේසුන්දර | දිස්ත්‍රික් කළමණාකරු | NAITA |
| 117 | එල්.ජී.වාමනි සෝමදාස | DC | ගොවිජන සංවර්ධන දෙපාතර්මේන්තුව |
| 118 | එල්.පී.ඩී.පී.ජයසේකර | Registrar | හාඩි තාක්ෂනික ආයතනය |
| 119 | කේ.එම්.කුලතුංග | DRPM (D) | MACL |
| 120 | බී.එල්.පී.යූ.සිල්වා | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී | මිනින්දෝරු දෙපාතර්මේන්තුව |
| 121 | එස්.පරමේෂ්වරම් | අධ්‍යක්ෂ | LRC |
| 112 | කේ.එල්.ඒ. ආරියකීර්ති | A/Director | 1DB |
| 123 | එස්.ඒ.ඩී.ඩබ්.කුමාර | DIE - Ampara | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 124 | ජී.ඩබ්.ඒ.එස්.ජයසේකර | DEO | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 125 | ඩබ්.ඒ.ඒ.අල්මත් | DIN | වාරිමාගර් දෙපාතර්මේන්තුව |
| 126 | ඉංජි.ඒ.එල්.නියාස් | DIE - Pothuvil | වාරිමාගර් දෙපාතර්මේන්තුව |
| 117 | ඉංජි. කපිල ජේ | ප්‍රාදේශීය කළමණාකරු | ජලසම්පාදන මණ්ඩලය |
| 128 | කේ.ඒ.නලින් | RCCD | Co-op |
| 129 | ආර්.සී.රණපුර | CSD Ampara | CSD Ampara |
| 120 | එම්.පී.සී.පී. කුමාර | CSD Uhana | Csd Uhana |
| 121 | කේ.ටී.එස්.කුමාර | Head of agriculture | Galoya Plantation |
| 132 | ඉංජි.පී. අච්චුදන් | CE Building | Department of building |
| 133 | එම්.ඒ.සී.එම්.රියාස් | අධ්‍යක්ෂ | DMC Ampara |
| 134 | එම්.එස්.එම්.සෆ්රි | අධ්‍යක්ෂ | සමන්තුර |
| 135 | වෛද්‍ය එම්.ඒ.මජීඩ් | | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කායර්ාලය |
| 136 | ආර්.ඥාණවෙල්වම් | DPD | ASMP - EP |
| 132 | කේ.එල්.ඩී.බී.පී. සෙනෙවිරත්න | විදුලි අධිකාරි | ලංකා විදුලිබල මණ්ඩලය |

## දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්පාර දිස්ත්‍රික්කය
**2023.08.29**

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 138 | එම්.ආර්.එම්.ෆරිස් | RME | GSMB |
| 139 | එම්.එස්.එම්.නවාස් | DIE | වාරිමාගර් දෙපාතර්මේන්තුව |
| 140 | යූ.පී.එච්.උළුවඩුගේ | ප්‍රාදේශීය කළමණාකරු | රාජ්‍ය දැව සංස්ථාව |
| 140 | එස්.එම්.ආර්.පී.ධනංජය | ශාඛා කලමණාකරු | සනස සංවධර්න බැංකුව -උහන |
| 142 | වයි.එම්.එස්.එස්.යාපා | RPM | RPM Office |
| 143 | කේ.සිවකුමාර් | දිස්ත්‍රික් සමුද්‍ර පරිසර නිළධාරි | දිස්ත්‍රික් සමුද්‍ර පරිසර අධිකාරිය |
| 144 | ඩී.කේ.එම්.එම්.එම්. කුමාරිහාමි | ලේකම් | ප්‍රාදේශීය සභාව - නාමල්ඔය |
| 145 | ආර්.එම්.සිරිවධර්න | ලේකම් | ප්‍රාදේශීය සභාව - ලාහුගල |
| 146 | අනෝමා රාජපක්ෂ | ලේකම් | ප්‍රාදේශීය සභාව - දමන |
| 142 | එම්.ඒ.පී. මැදගොඩ | ලේකම් | ප්‍රාදේශීය සභාව - උහන |
| 148 | එල්.ජී.අයි.පී.කුමාර | ලේකම් | ප්‍රාදේශීය සභාව - මහඔය |
| 149 | ජී.ජී.ධර්මසීලි | ලේකම් | ප්‍රාදේශීය සභාව - පදියතලාව |
| 150 | අයි.ජී.එස්.ජී කුමාරි | ලේකම් | ප්‍රාදේශීය සභාව - දෙහිඅත්තගණ්ඩිය |
| 151 | එල්.එම්.ඉර්ෆාන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අක්කරලත්තු |
| 152 | හබීබුරාහමන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - පොතුවල් |
| 153 | එම්.ආර්.එම්.රෂීඩ් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නින්දවර් |
| 154 | එස්. පඹිරතන් | ලේකම් | ප්‍රාදේශීය සභාව - නාවිදන්වේලි |
| 155 | ඒ.එම්.ඉලියාස් | ලේකම් | ප්‍රාදේශීය සභාව - එරගම |
| 156 | එම්.අය්.එම්. ෆායිස් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අඩ්ඩාලච්චේන |
| 157 | අයි. සුරේස්රම් | ලේකම් | ප්‍රාදේශීය සභාව - අලයාඩිවෙම්බු |
| 158 | ජේ. වීරපතිරණ | ලේකම් | ප්‍රාදේශීය සභාව -තිරුක්කෝවිල් |
| 159 | ඒ.සුන්දරකුමාර් | ලේකම් | ප්‍රාදේශීය සභාව - කාරතිව් |
| 160 | ඒ.ටී.එම්. රෆී | ලේකම් | නගරසභාව - අක්කරපත්තු |